**ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

**ஆரம்பக் கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு**

**MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය :<br>எனது இல : NSE/DEV/03/04<br>My No.: | ඔබේ අංකය :<br>உமது இல:<br>Your No. : | දිනය:<br>திகதி: 2019.03. 14<br>Date : |

චක්‍රලේඛ අංක : NSE/EL/01/2018 (1)

සියලුම දිසාපති/දිස්ත්‍රික් ලේකම්වරුන්, පළාත් සමාජ සේවා අධ්‍යක්ෂවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය</u>

<u>වයස අවුරුදු 70 ඉක්මවූ අඩු ආදායම්ලාභී වැඩිහිටියන්ට රු.2,000/- ක මාසික දීමනාවක් ගෙවීම.</u>

මගේ සමාංක හා 2018.10.15 දිනැති චක්‍රලේඛ අංක NSE/EL/01/2018 හා බැඳේ.

එම චක්‍රලේඛයේ **2.1.2** වගන්තිය සහ **3** කරුණ යටතෙහි පවතින වගන්ති පහත පරිදි සංශෝධනය කරමි.

**2.1.2** පවුලේ මාසික ආදායම රු.**6,000/-** හෝ ඊට අඩු වීම.

**3.** *<u>වැඩිහිටි නිවාසවල සිටින වයස අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන් සඳහා රු.2,000/- ක මාසික දීමනාව ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය</u>*

3.1 ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ / පළාත් සමාජසේවා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති, නොමිලේ නේවාසිකයන් රැකබලා ගන්නා, වැඩිහිටි නිවාසවල වයස අවුරුදු 70 සම්පූර්ණ වී ඇති ජ්‍යෙෂ්ඨ පුරවැසියන් මෙම දීමනාව ලැබීමට සුදුසුකම් ලබයි.


| | | |
|---|---|---|
| අමාත්‍ය/அமைச்சர்/Minister | දුරකථන/தொ.பே./Tel. : 011 - 2861 145 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2884 613 |
| රාජ්‍ය අමාත්‍ය/இராஜாங்க அமைச்சர்/ State Minister | දුරකථන/தொ.பே./Tel. : 011- 2877841 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011-2877 606 |
| නියෝජ්‍ය අමාත්‍ය/ பிரதி அமைச்சர்/Deputy Minister | දුරකථන/தொ.பே./Tel. : 011 - 2877 121 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2877 126 |
| ලේකම්/செயலாளர்/Secretary | දුරකථන /தொ.பே./Tel. : 011 - 2883 525 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2187 007 |
| අමාත්‍යාංශ කාර්යාලය/அலுவலகம்/General Office | දුරකථන/தொ.பே./Tel. : 011 - 2887 349-51 | ෆැක්ස්//பெக்ஸ்/Fax : 011 - 2877 127 |

අමාත්‍යාංශය / அமைச்சு / Ministry: 1වන මහල, සෙත්සිරිපාය අදියර II, බත්තරමුල්ල. / 1ஆவது மாடி, செத்சிறிபாயகட்டம்II, பத்தரமுல்லை. / 1st Floor Sethsiripaya Stage II, Battaramulla

විද්‍යුත්තැපැල/மின்னஞ்சல்/E-Mail : msesecretary@sltnet.lk

වෙබ් අඩවිය/இணையத்தளம்/Website: www.socialemwelfare.gov.lk

3.2 මෙහිදී අදාළ මුදල වැඩිහිටි නිවාසයේ පාලක සභාව වෙත ලබා දීමට කටයුතු කළ යුතු අතර, එම මුදලින් රු.1,400/- ක මුදලක් නේවාසික වැඩිහිටියන්ගේ ආහාරපාන සහ අවශ්‍ය ඖෂධ ලබාදීම වෙනුවෙන් යොදවන ලෙසට සහ ඉතිරි රු.500/- ක මුදල ප්‍රතිලාභී නේවාසික වැඩිහිටි පුද්ගලයින්ගේ අතට ලබා දීමට කටයුතු කරන ලෙසටත් උපදෙස් ලබා දිය යුතුය. ඒ අනුව එම මුදල ඉහත කාර්යයන් වෙනුවෙන් වියදම් කළ බවට නිවාසයෙහි පාලක සභාව විසින් සහතික විය යුතු අතරම, වැඩිහිටියන් වෙත මුදල් ලබාදීමේදී එම මුදල් ඔවුන් විසින් ලබාගත් බවට අත්සන් සහිත නාම ලේඛණයක් පවත්වාගෙන යා යුතුය. සුදුසුකම් ලබන නේවාසික වැඩිහිටි සංඛ්‍යාව සහ ඔවුන්ගේ තොරතුරු ඇතුලත් ලේඛනය අදාළ නිවාසයේ පාලකගේ අත්සනින් යුතුව ප්‍රාදේශීය කමිටුවෙහි නිර්දේශය සහිතව සහ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සමඟින් ලබා ගත යුතුය.

3.3 සෑම මසකම ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව දීමනාව ලබන නේවාසිකයින්ගේ ගෙවීම් නාම ලේඛනයෙහි පිටපතක් පළාත් සමාජසේවා අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.

3.4 මෙම දෙනු ලබන මුදල් ඉහත 3.2 හි සඳහන් කාර්යයන් වෙනුවෙන් යොදවන්නේද පිළිබඳව වැඩිහිටි විෂයය සම්බන්ධ අදාළ නිලධාරි විසින් පසු විපරම් කිරීමක් සිදුකළ යුතුය.

එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්,
ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්
ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම්
අමාත්‍යාංශය
1 වන මහල, සෙත්සිරිපාය - II අදියර
බත්තරමුල්ල.